# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1957/14 - 2016 මාර්තු මස 08 වැනි අඟහරුවාදා - 2016.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත**

36 වගන්තිය යටතේ කෙරෙන නියෝගය

**දේශීය ගුවන් තොටුපල සංවර්ධනය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ ඇති ජාතික අයවැය - 2016 යටතේ යෝජනා කරනු ලැබූ දේශීය ගුවන් තොටුපල සංවර්ධනය කිරීම සඳහා මෙහි උප ලේඛනයේ දක්වා ඇති ඉඩම් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට පවරා ගැනීම, සිවිල් ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයා වන නිමල් සිරිපාල ද සිල්වා වන මා විසින්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනතේ 36 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අනුමත කරනු ලැබ ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2016 මාර්තු මස 01 වන දින,
සෙත්සිරිපාය II අදියර, බත්තරමුල්ල,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉඩම පිළිබඳ විස්තර සහ දළ මායිම්* | *අවශ්‍ය ඉඩම් ප්‍රමාණය දළ වශයෙන්* |
|---|---|---|---|---|
| 1. | පුත්තලම | පුත්තලම | පාලවිය ගුවන් තොටුපලට නිරිත දිගින් පහත භූගෝලීය ඛංඩාංක මගින් ආවරණය කෙරෙන චතුරස්‍රාකාර හැඩති පොල් ඉඩම<br>$7^{0}$ 58' 37.42'' උ, $79^{0}$ 51' 00.95'' නැ<br>$7^{0}$ 58' 28.76'' උ, $79^{0}$ 51' 00.52'' නැ<br>$7^{0}$ 58' 15.61'' උ, $79^{0}$ 50' 35.70'' නැ<br>$7^{0}$ 58' 23.67'' උ, $79^{0}$ 50' 52.50'' නැ | හෙක්ටයාර 25 |
| 2. | බදුල්ල | හපුතලේ | හපුතලේ, තොටලාගල ශවුඩ් තේ වත්තේ පහත භූගෝලීය ඛංඩාංක මගින් ආවරණය කෙරෙන බහුඅස්‍රාකාර හැඩැති ඉඩම<br>$6^{0}$ 46' 27.59'' උ, $79^{0}$ 58' 07.56'' නැ<br>$6^{0}$ 47' 37.44'' උ, $79^{0}$ 59' 15.42'' නැ<br>$6^{0}$ 47' 29.42'' උ, $79^{0}$ 59' 25.26'' නැ<br>$6^{0}$ 46' 17.40'' උ, $79^{0}$ 58' 12.29'' නැ. | හෙක්ටයාර 50 |

03 - 592



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*